# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,138 - 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2019.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 456 |


*සැ. යු.* -(i) උකස් (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 සැප්තැම්බර් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

455 - B 081553 — 353 (2019/08)
D 1 -

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

2007 අංක 7 දරන සමාගම් පනතේ 270(b) සහ/හෝ 270(c) සහ/හෝ 270(e) සහ/හෝ 270(f) වගන්තිවල විධිවිධාන යටතේ සහ ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමක් වන කෝට්ටේ තලවතුගොඩ පාර, අංක 159/2E දරන ස්ථානයේ පිහිටි නිව් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමේ කටයුතු ඇවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමයි.

නඩු අංකය : HC (Civil) 55/2019 (CO)

නිව් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 159/2E, තලවතුගොඩ පාර,
කෝට්ටේ.

.............................*පෙත්සම්කරු.*

කොළඹ පිහිටි සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බද මහාධිකරණය වෙත ඉහත නම් සඳහන් සමාගම විසින් 2019 ජූලි මස 15 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2019.10.07 වැනි දින අධිකරණය ඉදිරියේ අඬගැසිය යුතු බවට නියම කරන බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අඬගසන අවස්ථාවේ දී පුද්ගලිකව නීතිඥවරයෙකු හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බවත් මෙයින් දක්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටි ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත සඳහන් අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

*අත්සන් තබන ලදී* :- ශ්‍රීමාල් වීරක්කොඩි,
පෙත්සම්කාර සමාගමේ ලේඛනගත නීතිඥ,
අංක 494/2බී, එන්. ටී. පෙරේරා මාවත,
අංගොඩ.

ඉහත පෙත්සම අඬ ගැසීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ වෙත ලිඛිතව පැමිණ හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීමට අවශ්‍ය වන අතර, එම පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ පුද්ගලයා හෝ ආයතනයේ සිය නීතිඥවරු ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීමට හා 2019.10.05 වැනි දින පස්වරු 01.00ට පෙර ඉහත නම් සඳහන් නීතිඥවරයාට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර දීමට හෝ තැපැල් කිරීමට අවශ්‍ය වේ."

පෙත්සම්කාර සමාගමේ ලේඛනගත නීතිඥ තැන.

08-896

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.